ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL)

කාර්ය මණ්ඩල ඇබෑර්තු

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින්, ජාතික ව්‍යවස්ථාදායක අවශ්‍යතා සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශිත පරිචයන් (SARPS) හට අනුකූල, උපායමාර්ගික සැලසුම් කිරීම, වෘත්තීය මඟපෙන්වීම හා දැඩි ආවේක්ෂණය හා මනා ලෙස ස්ථාපිතවූ නියාමන කාර්ය රාමුවක් යටතේ, ප්‍රවේශමිකාරී, ආරක්ෂිත, කාර්යක්ෂම, ක්‍රමික, පරිසර හිතකාමී, ජාතික සිවිල් ගුවන් සේවයක් සඳහා සහතික වෙයි. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින්, පහත සඳහන් තනතුරු සඳහා වන ඇබෑර්තු පිරවීම සඳහා, කාර්යශූර, උද්යෝගී, හා ස්වයං ගාමක හා මනා සුදුසුකම්වලින් හෙබි පෘථුල පළපුරුද්ද සහිත අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඒකාබද්ධ කළමනාකරණ)
තනතුරු කේතය HM-2-1-DDG3 තනතුරු ගණන - 01

හිමිවන වැටුප

- මූලික වැටුප – රුපියල් 91, 645/- බඳවා ගැනීම් අවස්ථාවේදී ගෙවනු ලැබේ. (MS චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව වැටුප් පරිමාණය – රුපියල් 91,645 – 12X2,700 – 124,045/-)
- වෙනත් දීමනා – ජීවන වියදම් අංක දීමනාව – රුපියල් 7,800/- + ඉන්ධන දීමනාව – 140 1+ ප්‍රවාහන දීමනාව රුපියල් 50,000/- (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම්) + MS චක්‍රලේඛ අංක 05/2017 ප්‍රකාරව වෘත්තීය දීමනාව.
- අනෙකුත් ප්‍රතිලාභ – සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනාක්‍රමය, මරණ ප්‍රදාන යෝජනා ක්‍රමය, ප්‍රසාද දීමනා, ලබානොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම, ජංගම දුරකථන බිල්පත් සඳහා මුදල් ප්‍රතිපූර්ණය.

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, වසර තුනකට (03) නොඅඩු කාලයක, ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ්‍යය හෝ පරිපාලනය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්;

සහ

2. ආර්ථික විද්‍යාව ගණකාධිකරණය කළමනාකරණය වාණිජ්‍යය පරිපාලනය ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ මූල්‍ය, කළමනාකරණය හෝ පරිපාලන ක්ෂේත්‍රයකට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය;

සහ

3. මූල්‍ය, කළමනාකරණ, පරිපාලන හෝ විගණන ක්ෂේත්‍රයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක, කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර දහඅටක (18) සේවා පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

තෝරාගැනීම් - 1

සඳහන් කොට ඇති බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අවශ්‍යතා සතුවිය යුතුය.

තෝරාගැනීම් - 2

1. CAASL ආයතනයේ, අධ්‍යක්ෂ (මානව සම්පත් හා දේපළ කළමනාකරණය), අධ්‍යක්ෂ (මූල්‍ය හා ආදායම් කළමනාකරණය) හෝ අධ්‍යක්ෂ (තත්ත්ව හා අභ්‍යන්තර විගණන) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්ද;

සහ

2. පසුගිය වසර පහ (05) තුළ පවත්වාගත් නිකැළැල් සේවා වාර්තාවක් තිබීම හා වර්තමාන තනතුරට අදාළ සියලුම වැටුප් වර්ධක ලබා තිබීම;

සහ

3. වාර්ෂික කාර්යසාධනයේ දී "හොඳයි" හෝ ඉහළ ශ්‍රේණිගත කිරීමක් ලබා තිබීම.

සහ

4. බහු – ක්ෂේත්‍රවලට අයත් කණ්ඩායම්වලට නායකත්වය දීමේ හා දිශානති කිරීමේ සනාථ කළ හැකියාව මානව හා අනෙකුත් සම්පත් සම්බන්ධයෙන් මනා සංවර්ධනය හා කාර්යක්ෂම කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද.

අධ්‍යක්ෂ (ගගන යාත්‍රාංගන)
තනතුරු කේතය HM-1-1-D2 තනතුරු ගණන - 01

හිමිවන වැටුප

- මූලික වැටුප – රුපියල් 80,295/- බඳවා ගනු ලබන අවස්ථාවේදී ගෙවනු ලැබේ. (MS චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව වැටුප් පරිමාණය – රුපියල් 80,295- 15X2,270-114,345/-)
- වෙනත් දීමනා – ජීවන වියදම් අංක දීමනාව – රුපියල් 7,800/- + ඉන්ධන දීමනාව – 120 1+ ප්‍රවාහන දීමනාව – රුපියල් 50,000/- (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම්) + විශේෂ තාක්ෂණ දීමනාව (අවශ්‍යතා සඳහා කරුණාකර, CAASL වෙබ් අඩවියට යොමුවන්න.) – රුපියල් 225,000/-
- වෙනත් ප්‍රතිලාභ – සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය, හදිසි අනතුරු යෝජනා ක්‍රමය, මරණ ප්‍රදාන යෝජනාක්‍රමය, ප්‍රසාද දීමනා, ලබානොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම, ජංගම දුරකථන බිල්පත් සඳහා මුදල් ප්‍රතිපූර්ණය.

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

තෝරාගැනීම් 1

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් භෞතික විද්‍යාව, ගගනතල ඉංජිනේරු ගුවන් ප්‍රවාහන, ගගනනාවික ඉංජිනේරු හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු කාලයක ප්‍රථම උපාධියක්;

සමග

2. ගුවන් සේවා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ ගුවන් සේවා ආශ්‍රිත පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ සමාන ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත් සංවිධානයකින් පවත්වනු ලබන සති (06) හයකට නොඅඩු කාලයක ගගන යාත්‍රාංගන සහතික කිරීමේ පාඨමාලාව (කළමනාකරණ තලය) ඇතුළත්ව පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කොට තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් පිළිගනු ලබන සමාන සුදුසුකම්.

සහ

3. කළමනාකරණ තලයේ, ගගන යාත්‍රාංගන මෙහෙයුම් ක්ෂේත්‍රයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක, රජයට අයත් සමාගමක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වසර දහයක (10) පළපුරුද්ද.

තෝරාගැනීම් 2

1. පශ්චාත් උපාධි (සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ මාස්ටර්ස් උපාධිය) සුදුසුකම් හෝ ගුවන් සේවාවන්ට අදාළව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය හෝ සමාන ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත් සංවිධානයකින් පවත්වනු ලබන සති හයකට (06) නොඅඩු කාලයක පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කිරීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් පිළිගනු ලබන සමාන සුදුසුකම්;

සහ

2. ගගන යාත්‍රාංගණ ක්ෂේත්‍රයේ, කළමනාකරණ තලයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක / රජයට අයත් සමාගමක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර දහතුනක (13) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

තෝරාගැනීම් - 1

සඳහන් කොට ඇති බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අවශ්‍යතා සතුවිය යුතුය.

තෝරාගැනීම් - 2

පහත සඳහන් සියලු අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

1. ගගන යාත්‍රාංගණ ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM1-1) ශ්‍රේණියේ 1 තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබිය යුතුය;
2. පසුගිය වසර පහ (05) තුළ පවත්වාගත් නිකැළැල් සේවා වාර්තාවක් තිබීම හා වර්තමාන තනතුරට අදාළ සියලුම වැටුප් වර්ධක ලබා තිබීම.
3. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ එහි පිළිගත් ආයතනයක් විසින් පවත්වනු ලබන අධිකාරිය විසින් පිළිගත් සති හයකට (06) නොඅඩු කාලයක ගගන යාත්‍රාංගණ ක්ෂේත්‍රයේ හා ගගන යාත්‍රාංගණ සහතික කිරීමේ උසස් පුහුණු පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කොට තිබිය යුතුය;
4. වාර්ෂික කාර්යසාධනයේදී "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණිගත කිරීමක් ලබා තිබීම.

ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගගන නාවික තොරතුරු සේවා)
තනතුරු කේතය MM-1-1-AN2 තනතුරු ගණන - 01

හිමිවන වැටුප

- මූලික වැටුප – රුපියල් 53,175/- බඳවා ගැනීමේදී ගෙවනු ලැබේ. වැටුප් පරිමාණය : රුපියල් 53,175-10X1,375-15X1,910-95,575/- (MS චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව)
- වෙනත් දීමනා – ජීවන වියදම් අංක දීමනාව රුපියල් 7,800/-+ කළමනාකරු දීමනාව – රුපියල් 50,000/-+ විශේෂ තාක්ෂණ දීමනාව (කරුණාකර, අවශ්‍යතා සඳහා CAASL වෙබ් අඩවිය වෙත යොමු වන්න.) – 100,000/-
- වෙනත් ප්‍රතිලාභ – සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනාක්‍රමය, මරණ ප්‍රදාන යෝජනාක්‍රමය, ප්‍රසාද දීමනා, ලබානොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම, ජංගම දුරකථන බිල්පත් සඳහා මුදල් ප්‍රතිපූර්ණය.

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

තෝරාගැනීම් 1

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් භෞතික විද්‍යාව, ප්‍රවාහනය, ගගනතල, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හෝ ඉංජිනේරු ධාරාවේ වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක් සහ රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය ව්‍යවසායක හෝ ගුවන්සේවා ක්ෂේත්‍රයේ නියුතු ප්‍රසිද්ධ වෙළඳ ආයතයක, අදාළ ක්ෂේත්‍රයේ, විධායක තලයේ, අවම වශයෙන් වසර අටකට (08) නොඅඩු සුදුසුකම් ලැබීමටත් පසු පළපුරුද්ද.

තෝරාගැනීම් - 2

පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අන්තර්මධ්‍යම විභාගය සමත්වීම සමග ගුවන් සේවා කටයුතුවල නියැලි රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය ව්‍යවසායක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, සුදුසුකම් ලැබීමෙන් පසු විධායක තනතුරක අවම වශයෙන් වසර අටක (08) පළපුරුද්ද.

තෝරාගැනීම් - 3

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ, ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග ගුවන්සේවා කටයුතුවල නියැලි රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය ව්‍යවසායක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක අවම වශයෙන් වසර අටක (08) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

තෝරාගැනීම් - 1

සඳහන් කොට ඇති බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අවශ්‍යතා සතුවිය යුතුය.

තෝරාගැනීම් 2

1. සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගගන නාවික තොරතුරු සේවා) ලෙස අවම වශයෙන් වසර හයක (06) සේවා පළපුරුද්ද.

සහ

2. පසුගිය වසර හය (06) තුළ පවත්වාගත් නිකැළැල් සේවා වාර්තාවක් තිබීම හා වර්තමාන තනතුරට අදාළ සියලුම වැටුප් වර්ධක ලබා තිබීම;

සහ

3. ගගනනාවික තොරතුරු සේවා ක්ෂේත්‍රයේ, සති හතරක (04) කාලයකට නොඅඩු, ICAO ආයතනය විසින් අනුමත කළ පුහුණු පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කොට තිබීම;

සහ

4. වාර්ෂික කාර්යසාධනයේදී "හොඳයි" හෝ ඉහළ ශ්‍රේණිගත කිරීම ලබා තිබීම.

ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන්ගමන් කළමනාකරණ - තාක්ෂණික)
තනතුරු කේතය MM-1-1-AN3 තනතුරු ගණන - 01

හිමිවන වැටුප

- මූලික වැටුප – රුපියල් 53,175/- බඳවාගනු ලබන අවස්ථාවේදී ගෙවනු ලැබේ. (වැටුප් පරිමාණය – MS චක්‍රලේඛය අංක 02/2016 ප්‍රකාරව, රුපියල් 53,175-10X1,375-15X1,910-95,575/-)
- වෙනත් දීමනා – ජීවන වියදම් අංක දීමනාව – රුපියල් 7,800/- + කළමනාකරු දීමනාව – රුපියල් 50,000/- + විශේෂ තාක්ෂණ දීමනාව (කරුණාකර, අවශ්‍යතා සඳහා CAASL වෙබ් අඩවිය වෙත යොමුවන්න) – රුපියල් 170,000/-
- වෙනත් ප්‍රතිලාභ – සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනාක්‍රමය, මරණ ප්‍රදාන යෝජනාක්‍රමය, ප්‍රසාද දීමනා, ලබානොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම, ජංගම දුරකථන බිල්පත් සඳහා මුදල් ප්‍රතිපූරණය

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

තෝරාගැනීම් 1

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, වසර හතරක (04) කාලයකට නොඅඩු ඉලෙක්ට්‍රොනික / විදුලි සංදේශ / ඒවියෝනික විද්‍යා ක්ෂේත්‍රයේ ඉංජිනේරු ප්‍රථම උපාධියක් සමග රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය ව්‍යවසායක හෝ ගුවන් තරණ සේවා හා බිම් සහාය සේවා සැපයීමේ නිරත ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක ඉලෙක්ට්‍රොනික / විදුලි සංදේශ / ඒවියෝනික ඉංජිනේරු ලෙස සුදුසුකම් ලැබීමෙන් පසුව වසර අටකට (08) නොඅඩු පළපුරුද්ද තිබිය යුතුය.

තෝරාගැනීම් 2

පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක අන්තර්මධ්‍යම විභාගය සමත්වීම සමග ගුවන් තරණ සේවා හා බිම් සහාය සේවා සැපයීමේ නිරත රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක ඉලෙක්ට්‍රොනික / විදුලි සංදේශ / ඒවියෝනික ඉංජිනේරු ලෙස සුදුසුකම් ලැබීමෙන් පසුව වසර අටකට (08) නොඅඩු පළපුරුද්ද තිබිය යුතුය.

තෝරාගැනීම් 3

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ සති හයකට (06) නොඅඩු කාලයක පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කිරීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් පිළිගනු ලබන සමාන සුදුසුකම්;

සහ

2. ගගන යාත්‍රාංගණ ක්ෂේත්‍රයේ, කළමනාකරණ තලයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක / රජයට අයත් සමාගමක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර දහතුනක (13) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

තෝරාගැනීම් - 1

සඳහන් කොට ඇති, බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අවශ්‍යතා සතුවිය යුතුය.

තෝරාගැනීම් - 2

1. සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණ – තාක්ෂණික) ලෙස අවම වසර හයක (06) සේවා පළපුරුද්ද.

සහ

2. පසුගිය වසර හය (06) තුළ පවත්වාගත් නිකැළැල් සේවා වාර්තාවක් තිබීම හා වර්තමාන තනතුරට අදාළ සියලුම වැටුප් වර්ධක ලබා තිබීම;

සහ

3. ගුවන් ගමන් කළමනාකරණ ක්ෂේත්‍රයේ, සති හතරක (04) කාලයකට නොඅඩු, ICAO ආයතනය විසින් අනුමත කළ පුහුණු පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කොට තිබීම.

සහ

4. තියි වාර්ෂික කාර්යසාධනයේදී "හොඳයි" හෝ ඉහළ ශ්‍රේණිගත කිරීමක් ලබා තිබීම.

ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් සංතරණ කාලගුණ)
තනතුරු කේතය MM-1-1-AN5 තනතුරු ගණන - 01

හිමිවන වැටුප

- මූලික වැටුප – රුපියල් 53,175/- බඳවාගනු ලබන අවස්ථාවේදී ගෙවනු ලැබේ. (වැටුප් පරිමාණය – MS චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව, රුපියල් 53,175-10X1,375-15X1,910-95,575/-)
- වෙනත් දීමනා – ජීවන වියදම් අංක දීමනාව – රුපියල් 7,800/- + කළමනාකරු දීමනාව – රුපියල් 50,000/- + විශේෂ තාක්ෂණ දීමනාව (කරුණාකර, අවශ්‍යතා සඳහා CAASL වෙබ් අඩවිය වෙත යොමුවන්න) – රුපියල් 120,000/-
- වෙනත් ප්‍රතිලාභ – සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනාක්‍රමය, මරණ ප්‍රදාන යෝජනාක්‍රමය, ප්‍රසාද දීමනා, ලබානොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම, ජංගම දුරකථන බිල්පත් සඳහා මුදල් ප්‍රතිපූරණය

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර තුනක (03) නොඅඩු කාලයක් සඳහා වූ විද්‍යාපීඨම උපාධියක් ලබා තිබිය යුතු අතර, එය, වායුගෝලීය භෞතික විද්‍යාව, භෞතික විද්‍යාව, ප්‍රවාහනය, ගගනතල කර්මාන්ත, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ ඉංජිනේරු ධාරාවේ අධ්‍යයන කටයුතු සිදුකොට තිබිය යුතු අතර, කාලගුණ විද්‍ය අංශයේ කටයුතු කරනු ලබන රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය ව්‍යවසායයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක කාලගුණ අනාවැකි පවසන්නෙකු හෝ කාලගුණ විද්‍යඥයකු ලෙස, සුදුසුකම් ලැබීමෙන් පසු අවම වසර 08 ක පළපුරුද්ද තිබිය යුතුය.

ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා ප්‍රමිති) — තනතුරු කේතය MM-1-1-AW1
ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් මෙහෙයුම්කරු සහතික කිරීම් සහ පරීක්ෂණ) — තනතුරු කේතය MM-1-1-AW3
තනතුරු ගණන - 02

- විශේෂයෙන් මත්තල CAASL කාර්යාලය සඳහා බඳවා ගැනේ.

හිමිවන වැටුප

- මූලික වැටුප – රුපියල් 53,175/- බඳවාගනු ලබන අවස්ථාවේදී ගෙවනු ලැබේ. (වැටුප් පරිමාණය – MS චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව, රුපියල් 53,175-10X1,375-15X1,910-95,575/-)
- වෙනත් දීමනා – ජීවන වියදම් අංක දීමනාව – රුපියල් 7,800/- + කළමනාකරු දීමනාව – රුපියල් 50,000/- + විශේෂ තාක්ෂණ දීමනාව (අවශ්‍යතා) සඳහා කරුණාකර CAASL වෙබ් අඩවිය වෙත යොමුවන්න) – රුපියල් 270,000/-
- වෙනත් ප්‍රතිලාභ – සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනාක්‍රමය, මරණ ප්‍රදාන යෝජනාක්‍රමය, ප්‍රසාද දීමනා, ලබානොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම, ජංගම දුරකථන බිල්පත් සඳහා මුදල් ප්‍රතිපූරණය

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

තෝරාගැනීම් 1

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, වසර හතරක (04) කාලයකට නොඅඩු යාන්ත්‍රික, විදුලි හෝ ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයේ ඉංජිනේරු ප්‍රථම උපාධියක් සමග ගුවන් සේවා කාර්යයන්හි කටයුතු කරන රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය ව්‍යවසායක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, ගුවන් යෝග්‍යතා පරීක්ෂක / ඉංජිනේරු හෝ ගුවන්යානා නඩත්තු ඉංජිනේරු ලෙස අවම වසර අටක (08) සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද.

තෝරාගැනීම් 2

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර්මධ්‍යම විභාගය සමත්වීම හෝ සමාන සුදුසුකම් සමග, වාණිජ ගුවන් සේවා, ගුවන්යානා නඩත්තුව හෝ අලුත්වැඩියා කිරීම් හෝ පියාසර පුහුණු හෝ ඉංජිනේරු පුහුණු කටයුතුවල නියුතු රාජ්‍ය හෝ පුද්ගලික ආයතනයක යාන්ත්‍රික, විදුලිමය හෝ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ලෙස, සුදුසුකම් ලැබීමෙන් පසු අවම වසර අටක (08) පළපුරුද්ද.

තෝරාගැනීම් 3

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තෘතියික හා වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හෝ ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍ර (AML) ලබාතිබීම සමග, වාණිජ ගුවන් සේවා, ගුවන්යානා නඩත්තු හෝ අලුත්වැඩියා හෝ පියසර පුහුණු හෝ ඉංජිනේරු පුහුණු කටයුතුවල යෙදෙන රාජ්‍ය හෝ පුද්ගලික සංවිධානයක යාන්ත්‍රික, විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු ලෙස අවම වසර අටක (08) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

තෝරාගැනීම් - 1

සඳහන් කොට ඇති බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අවශ්‍යතා සතුවිය යුතුය.

තෝරාගැනීම් - 2

1. අවම වශයෙන් වසර හයක (06) ක, අදළ වන පරිදි, සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතා – ගුවන් රාමු), සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතා – බල යන්ත්‍රාගාර), සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතා – ඒවියෝනික), සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතා – සැලසුම් හා නිෂ්පාදනය) තනතුරුවල සේවය කොට තිබිය යුතුය.

සහ

2. පසුගිය වසර හය (06) තුළ පවත්වාගත් නිකැළැල් සේවා වාර්තාවක් තිබීම හා වර්තමාන තනතුරට අදාළ සියලුම වැටුප් වර්ධක ලබා තිබීම

සහ

3. සති හතරක (04) නොඅඩු කාලයක, ගුවන් යෝග්‍යතා ක්ෂේත්‍රයේ ICAO ආයතනය විසින් අනුමත කළ පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කොට තිබිය යුතුය.

සහ

4. වාර්ෂික කාර්යසාධනයේ "හොඳයි" හෝ ඉහළ ශ්‍රේණිගත කිරීම ලබා තිබීම.

තාක්ෂක සහකාර (සිවිල්)
තනතුරු කේතය MA2-1-TA-1 තනතුරු ගණන - 01

හිමිවන වැටුප

- මූලික වැටුප – රුපියල් 30,130/- බඳවා ගැනීමේදී ගෙවනු ලැබේ. (වැටුප් පරිමාණය – MS චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව රුපියල් 30,310-10X300-7X350-4X495-20X660-50,940/-)
- වෙනත් දීමනා – ජීවන වියදම් අංක දීමනාව – රුපියල් 7,800/- + ප්‍රවාහන දීමනාව – රුපියල් 14,575/-
- අනෙකුත් ප්‍රතිලාභ – සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය, මරණ ප්‍රදාන යෝජනාක්‍රමය, ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ලබා දීම.

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කළ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ සිවිල් කාර්යයන්ට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම සහ අදළ ක්ෂේත්‍රයේ රාජ්‍ය හෝ පුද්ගලික ආයතනයක අවම වශයෙන් වසර තුනක (03) සේවා පළපුරුද්ද තිබිය යුතුය.

සිවිල් ගුවන් සේවා සහකාර
තනතුරු කේතය MA1-2-CAA තනතුරු ගණන - 03

හිමිවන වැටුප

- මූලික වැටුප – රුපියල් 27,910/- බඳවා ගැනීමේදී ගෙවනු ලැබේ. (වැටුප් පරිමාණය – MS චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව රුපියල් 27,910-10X300-7X350-12X600-12X710-49,080/-)
- වෙනත් දීමනා – ජීවන වියදම් අංක දීමනාව – රුපියල් 7,800/- + ප්‍රවාහන දීමනාව – රුපියල් 14,575/-
- අනෙකුත් ප්‍රතිලාභ – සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය, හදිසි අනතුරු, රක්ෂණ යෝජනාක්‍රමය, මරණ ප්‍රදාන යෝජනාක්‍රමය, ප්‍රසාද දීමනා, ලබානොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම.

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

අ.පො.ස. (සා/පෙළ) විභාගය,

(i) සිංහල / දෙමළ
(ii) ඉංග්‍රීසි භාෂාව
(iii) ගණිතය

යන විෂයයන් ඇතුළත්ව විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සහිතව විෂයයන් හයකින් (06) එකවර සමත්ව සිටිය යුතුය.

සහ

අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් විෂයයන් තුනක් (පොදු ප්‍රශ්නපත්‍රය හැර) සමත්ව සිටිය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්

තෝරාගැනීම් - 1

බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.

තෝරාගැනීම් - 2

අ.පො.ස. (සා/පෙළ) විභාගය,

(i) සිංහල / දෙමළ
(ii) ඉංග්‍රීසි භාෂාව
(iii) ගණිතය

යන විෂයයන් ඇතුළත්ව විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සහිතව විෂයයන් හයකින් (06) සමත්ව සිටිය යුතුය.

සහ

කාර්යාල සහායක හෝ රියදුරු ලෙස ස්ථිර සේවයේ අවම අවුරුදු 05 ක සතුටුදායක සේවාකාලයක් සම්පූර්ණ කළ අයහට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇත.

වයස් සීමාව

තනතුර	වයස් සීමාව	සටහන
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් / අධ්‍යක්ෂ	අවුරුදු 35 – 55 අතර	මෙම ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අයදුම්කරුවන්හට හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ, සීමාසහිත ගුවන්තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ, දේශීය ගුවන් සේවා හා පියසර පාසැල්වල සේවය කරන අයවලුන්හට අදළ නොවේ.
ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂක	අවුරුදු 22 – 45 අතර	
තාක්ෂණික සහකාර (සිවිල්